සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය - 2022

-----------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

| අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු වුවද, පරිහරණය කරමින් පවතින නමුත් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.116,208,946 ක් වූ දේපළ පිරියත හා උපකරණවල ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී විගණනය පෙන්වා දී ඇති පරිදි කටයුතු කෙරේ. | ප්‍රමිතිය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීවිත කාලය සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 ප්‍රකාරව විකල්ප ක්‍රමයක් ලෙස ඍජුව ආදායම් ප්‍රකාශයට හඳුනාගත හැකි ප්‍රාග්ධන ප්‍රදාන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හිමිකම් යටතේ දැක්වීම අධිකාරියේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වූයෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය රු. 24,630,679 ක් ආදායම් වශයෙන් හඳුනාගෙන තිබුණි. එසේ තිබියදී ප්‍රාග්ධන ප්‍රදානවලින් ද රු. 9,521,050 ක් ආදායම ලෙස මාරුකර තිබීමෙන් එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ ආදායම වැඩියෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කිරීම මඟින් අවශ්‍ය ගැලපීම සිදු කර මෙම දෝෂය නිවැරදි කිරීමට කටයුතු කෙරේ. | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල වන ආකාරයට ගිණුම්කරණ ප්‍රතිපත්තිය සකස් කරගෙන ප්‍රාග්ධන ප්‍රදාන නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩ නිමකර 2018 මාර්තු 30 දින අධිකාරිය වෙත භාර දී තිබුණු පිරිවැය රු.66,661,502 ක් වූ ගාල්ල ප්‍රාදේශීය කාර්යාල ගොඩනැගිල්ල සඳහා 2018 වර්ෂයට අදාළ ක්ෂය වටිනාකම රු.2,504,360 ක් වුවද, එය රු. 967,961 ක් ලෙස ගණනය කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගොඩනැගිලි ශුද්ධ අගය රු.1,536,399 ක් වැඩිපුර දක්වා තිබුණි. | ඉදිරියේදී ගිණුම්වල මෙම වෙනස නිවැරදි කරනු ලැබේ. | ගොඩනැඟිලි සඳහා වන නිවැරදි ක්ෂය වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු. 15,999,140 ක් වූ සේවක ණය අරමුදලෙහි ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හිමිකම් යටතේ පෙන්විය යුතු නමුත් එය ජංගම නොවන වගකීමක් වශයෙන් දක්වා තිබුණි. | විගණකාධිපති නිර්දේශ අනුව ගිණුම් තැබීම් කටයුතු සිදු කරනු ලැබේ. | සේවක ණය අරමුදලෙහි ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හිමිකම් යටතේ නිවැරදිව පෙන්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | MV-X-Press Perl නෞකා අනතුරට අදාළ රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් අධිකාරියේ නිලධාරීන්ට අමතර දීමනාවක් ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොතිබිය දී 2022 වර්ෂය සඳහා ඉල්ලුම් කළ මුදල | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව 2021 වර්ෂයේ සිට මෙම ගෙවීම් සඳහා වෙන්කිරීම් සිදුකර ඇත. යම් අවස්ථාවක මුදල් ගෙවීම සිදු | විධිමත් අධිකාරි බලය යටතේ පමණක් ගෙවීම් කිරීමට අවශ්‍ය වෙන්කිරීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.35,995,971 ක් සේවක වියදම් හා ගෙවිය යුතු දෑ වශයෙන් ගිණුම්ගත කිරීම හේතුවෙන් එම වටිනාකමින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු දෑ වැඩියෙන් ද, අතිරික්තය අඩුවෙන් ද දක්වා තිබුණි. | නොකළ හොත් එය ආපසු ලාභයට එකතු කිරීමට අවස්ථාව ඇත. | |
| (ඇ) | අධිකාරියේ වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සඳහා 2021 වර්ෂයේ ලියා 2022 වර්ෂයේ අවලංගු කරන ලද රු. 225,000 ක චෙක්පතක් වගකීමක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට "ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ" නමින් වූ ගිණුමට බැර කර හිමිකම් යටතේ දක්වා තිබුණි. තවද, භාවිත තත්ත්වයේ නොපවතින එම වෙබ් අඩවිය සඳහා ඉහත රු.225,000 ක් ඇතුලුව ගෙවන ලද රු.405,250 ක මුදල කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කරනු වෙනුවට අස්පෘශ්‍ය වත්කම් වශයෙන් ප්‍රාග්ධනිත කර තිබුණි. | එම දෝෂය 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් භාවිත තත්ත්වයට පවතින තෙක් කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | ඩම්පින් බලපත්‍ර නිකුත් කිරීම සඳහා රුහුණු විශ්ව විද්‍යාලය මඟින් සකස් කර භාවිතයේ පවතින Dumping Permit Management System සඳහා ගෙවියයුතු රු.1,400,000 ක් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එම වටිනාකමින් මූල්‍ය ප්‍රකාශනවල අස්පෘශ්‍ය වත්කම් හා ගෙවිය යුතු වියදම් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම පද්ධතියේ පරීක්ෂණ කාලය 2023 වර්ෂයේදී අවසන් කිරීමෙන් පසුව අස්පෘශ්‍ය වත්කම් වශයෙන් ගිණුම්ගත කිරීමට කටයුතු කෙරේ. | භාවිතයේ පවතින අස්පෘශ්‍ය වත්කම් හා ගෙවිය යුතු වියදම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රාග්ධන ප්‍රදානවලින් උපයෝජනය නොකළ මුදල් භාණ්ඩාගාරයට පියවීමට කටයුතු නොකර "ප්‍රාග්ධන කෙරීගෙන යන වැඩ" හා "උපයෝජනය නොකළ ප්‍රදාන" නමින් ගිණුම් දෙකකට මාරුකරගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ එම ගිණුම් දෙකට මාරු කරගත් පිළිවෙලින් රු.4,044,400 ක් හා රු.968,945 ක් සමඟ වර්ෂය අවසානයට එම ගිණුම් දෙකෙහි ශේෂය පිළිවෙලින් රු.8,259,144 ක් හා රු.2,440,518 ක් විය. | කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම් ගත කර ඇති මුදල් සහ වැඩසටහන් අවසන් වීමෙන් පසු ඉතිරි වී ඇති මුදල් මේ යටතේ දක්වා ඇත. අදාළ කාර්යයන් අවසන් වීමෙන් පසුව ඉතිරි වන මුදල් පවතී නම් භාණ්ඩාගාරය වෙත ආපසු යැවීමට 2023 වර්ෂය අවසානයේදී කටයුතු කරනු ලැබේ. | භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රාග්ධන ප්‍රදානවලින් උපයෝජනය නොකළ මුදල් භාණ්ඩාගාරයට පියවීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | MV X Press Perl නෞකා අනතුර මඟින් අපවිත්‍ර වූ වෙරළ පිරිසිදු කිරීම සඳහා සහභාගී වූ විවිධ කණ්ඩායම් හා අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා ආහාරපාන මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ගෙවීම් වවුචර 34 ක් මඟින් ගෙවීම් සිදුකර තිබුණ ද, පුද්ගල සංඛ්‍යාව හැර දුද්ගලයින් කවුරුන් ද යන්න දක්වා නොතිබීමෙන් සැබෑ සහභාගීත්වය මත ගෙවීම් කර ඇති බවට සනාථ කළ නොහැකි විය. | 8,153,485 | ඒ ඒ දිනයන්හි වෙරළ පිරිසිදු කිරීමේ කටයුතු සඳහා සහභාගි වූ ආයතන හා කාර්ය මණ්ඩලය ඇතුළත් පැමිණීමේ පත්‍රිකාව හා පූර්ව සැලසුම ආදී නිශ්චිත හා අනුමත කරන ලද තොරතුරු | කාර්යය මණ්ඩලයේ නාම ලේඛනය දෛනිකව ඉදිරිපත් කිරීම සිදු කර නොමැති නමුත් පැමිණීමේ හා ආහාර ලබා ගැනීමේ සාරාංශ ලේඛනයක් ඉදිරිපත් කර ඇත. මෙහෙයුම් ක්‍රියාවලියට සහභාගී වූ පිරිස් සම්බන්ධ නාම ලේඛන වෙන් වෙන් වශයෙන් ක්ෂේත්‍රයේ පවත්වාගෙන යනු ලබයි. | වෙරළ පිරිසිදු කිරීමේ කටයුතු සඳහා දෛනිකව සහභාගීවූවන්ගේ නාම ලේඛන හා ඔවුන් සඳහා දරන ලද වියදම පැහැදිළිව ගෙවීම් වවුචරයට අමුණා තිබිය යුතුය. |
| (ආ) | අධ්‍යක්ෂ මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය | - | 2022 වර්ෂයට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා | අදහස් දක්වා නැත. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(5) හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 7(I) වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණ වැළැක්වීමේ පනත | | | |
| (i) | 10(1) හා (2) උපවගන්තිය | 10(1) උපවගන්තිය පරිදි නියමයක් සිදු කිරීම සඳහා 2(1) උප වගන්තිය යටතේ නියෝග සාදා නොතිබීම හේතුවෙන් සමුද්‍ර දූෂණයක් වැළැක්වීමට, අඩු කිරීමට, පාලනය කිරීමට හෝ නතර කිරීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් දඩ අයකර ගැනීමට තිබූ අවස්ථා අහිමි වී ගොස් තිබුණි. | පනත අනුව ක්‍රියාකිරීමට නියෝග සෑදීම අවශ්‍ය නොවන අතර දඩ අයකර ගැනීමේ ප්‍රතිපාදන දැනට පවතී. කෙසේ වෙතත් පනත සංශෝධනයේදී දඩ මුදල් අයකර ගැනීමේ ක්‍රමවේදයන් කෙරෙහි ද අවධානය යොමු කිරීමට නියමිතය. | පනතේ 2(1) උප වගන්තිය අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 6(උ) උප වගන්තිය | හදිසි රසායන ද්‍රව්‍ය විසිරීමකදී ජාතික මට්ටමින් ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ සැලැස්මක් සකස් කර නොතිබුණි. | පනත සංශෝධනයේදී රසායනික ද්‍රව්‍ය විසිරීමකදී ජාතික මට්ටමේ සැලැස්මක් සකස් කිරීමට අදාළ ප්‍රතිපාදන ඇතුළත් කිරීමට නියමිත වේ. කෙසේ වුවද, රසායන ද්‍රව්‍ය විසිරීමේ අවධානම තේරුම් ගෙන හදිසි තෙල් විසිරීමේ සැලැස්මට රසායන ද්‍රව්‍ය විසිරීම ඇතුළත් කිරීමටත්, පවතින හදිසි තෙල් විසිරීමකදී ක්‍රියාත්මක ජාතික සැලැස්ම රසායනික ද්‍රව්‍ය විසිරීමකදී යොදා ගැනීමට හැකි වන පරිදි සංශෝධනය කිරීමටත් කටයුතු කරමින් පවතී. | පනතට අවශ්‍ය සංශෝධනයන් සිදු කර රසායන ද්‍රව්‍ය හා තෙල් විසිරීමේ සැලසුම් සකස් කර ඒ අනුව ක්‍රියාත්මක විය යුතුය. |
| (iii) | 14(3) (අ) උප වගන්තිය | අධිකාරියට එහි බලතල, කාර්යයන් සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට අදාළ කාරණා සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා | 2023 ජුනි මස 17 දින නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පරිසර සභාව පැවැත්වීමට | පනත ප්‍රකාරව සමුද්‍රීය පරිසර සභාවක් පිහිටුවා අධිකාරියට එහි බලතල, |

| | | | | |
|---|---|---|---|---|
| | | සමුද්‍රීය පරිසර සභාවක් පිහිටුවීමට කටයුතු කර නොතිබුණි. | කටයුතු සූදානම් කළ නමුත් එදින පරිසර සභාව පිහිටුවීමට සිටිය යුතු සාමාජිකයින් නොපැමිණීම හේතුවෙන් නැවත අගෝස්තු මස 10 වන දින අමාත්‍යාංශයේ දී මෙය පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. | කාර්යයන් සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට අදාළ කාරණා සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (iv ) | 16(3) උප වගන්තිය | අධිකාරියේ ලේකම් තනතුර සඳහා, නීතිමය ක්ෂේත්‍රයේ හෝ සමාගම් ලේකම් කටයුතු පිළිබඳව ප්‍රමාණවත් පළපුරුද්දක් සහ සුදුසුකම් ඇති නිලධාරියෙකු පත් කළ යුතු වුවද, 2022 සැප්තැම්බර් මස සිට එසේ නොවන අමාත්‍යාංශයේ නිලධාරින් ලේකම් තනතුර සඳහා පත්කර තිබුණි. එම නිලධාරීන්ට ගෙවීම් පිළිබඳ විස්තර ද විගණනයට ඉදිරිපත් නොවුණි. | කළමනාකරු නීති නිලධාරිණියගේ සේවා කාලය 2023 ජුනි මස 30 දින අවසන් වීමට ප්‍රථම ව අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු තමාට සිදු කිරීමට නොහැකි බව දන්වා 2022.10.19 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙන් ඉවත් ව යාම නිසා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ධුරයෙහි රාජකාරී කටයුතු සිදු කිරීමට නීතිමය ක්ෂේත්‍රයේ සුදුසු නිලධාරියෙකු අධිකාරිය තුළ නොමැති වීමෙන් ඒ සඳහා අභ්‍යන්තර සුදුසුකම් ඇති නිලධාරියෙකු බඳවා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපදෙස් ලබා දී ඇත. | පනත ප්‍රකාරව නීතිමය ක්ෂේත්‍රයේ හෝ සමාගම් කටයුතු පිළිබඳව ප්‍රමාණවත් පළපුරුද්දක් හා සුදුසුකම් සහිත නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 136 | අනුමැතියකින් තොරව අධිකාරියේ අභිමතය පරිදි 2021 වර්ෂයේ රු.3,283,838 ක් හා 2022 වර්ෂයේ රු.1,950,642 ක් වශයෙන් නිලධාරීන්ගේ රෝහල් ගාස්තු බිල්පත් අධිකාරිය මඟින් ගෙවා තිබුණි. | සියලුම රෝහල් ගාස්තු ගෙවීම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සිදු කර ඇති අතර දැරූ වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා දැනටමත් රක්ෂණ සමාගම වෙත ඉදිරිපත් කර ඇත. | රෙගුලාසි මඟින් අනුමත කරන ලද ප්‍රතිලාභ පමණක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සේවකයින්ට ලබාදීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 137(2) | අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ආරක්ෂාව සැපයීම සඳහා ගිවිසුම ප්‍රකාරව දිවා කාලයට හා රාත්‍රී කාලයට ආරක්ෂක නිලධාරින් දෙදෙනෙකු යෙදිය යුතු වුවද, එක් ආරක්ෂක නිලධාරියෙකු පමණක් පැය 24 පුරා එක දිගට දින ගණනාවක් සේවයේ යොදවා නිලධාරින් දෙදෙනෙකු සඳහා 2022 පෙබරවාරි 01 දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා රු.716,045 ක මුදලක් ගෙවා තිබුණි. තවද, ආරක්ෂක අමාත්‍යාංශයේ ලියාපදිංචි වී නොමැති මෙම ආයතනයේ ගනුදෙනුකරුවන් පිළිබඳ තොරතුරු ද ලබා නොගෙන කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | ආරක්ෂක සමාගමේ අභ්‍යන්තර ගැටළුවක් හේතුවෙන් සමහර අවස්ථා වලදී එක් නිලධාරියෙකු පමණක් සේවයේ යොදවනු ලබයි. නැවත ආරක්ෂක සේවා පහසුකම් ලබාගැනීම සඳහා ටෙන්ඩර්පත් කැඳවා මෙම ගැටළුව විසඳීමට කටයුතු කරනු ලැබේ. | ගිවිසුම ප්‍රකාරව ආරක්ෂක සේවය ලැබෙන බවට නිසි අධීක්ෂණයක් ඇති කළ යුතු අතර ගිවිසුමෙන් බැහැරව කටයුතු කර තිබියදී ගෙවීම් කිරීම හා සුදුසු ආරක්ෂක සේවා ආයතනයක් තෝරා නොගැනීම සම්බන්ධයෙන් නිලධාරින් වගකීමට බැඳී සිටිය යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 139 (8) හා (9) සහ 446 (2) | අධිකාරිය විසින් පවත්වාගනු ලැබූ ලිඛිත මුදල් පොත සහ Quick Book පද්ධතියෙහි ඇතුළත් මුදල් පොතෙහි ඇතැම් ගනුදෙනු නිවැරදිව ඇතුළත් කර නොතිබීම හා වෙනස්කම් පැවතීමත් දෛනිකව තුලනය කර මුදල් පොතේ ශේෂය පරීක්ෂා කර නොතිබීමත්, ලිඛිත මුදල් පොත තුලනය කර බැලීමේ දී වෙනස්කම් නිරීක්ෂණය වීමත් හා අධීක්ෂණ නිලධාරි විසින් අධීක්ෂණය කර නොතිබීමත් හේතුවෙන් නිසි සැලකිල්ලෙන් යුතුව නිවැරදිව මුදල් පොත පවත්වාගෙන නොයන බවට නිරීක්ෂණය විය. | මුදල් පොත ලිවීමේදී ලිපිකරණ දෝෂ සිදු වී ඇති නිසා එම වෙනස්කම් සිදු වී ඇත. ඉදිරියේ දී ලිපිකරණ දෝෂ ඇති නොවන ආකාරයට පියවර ගෙන ඇත. මුදල් පොත දෛනිකව අත්සන් කිරීමට ගණකාධිකාරීට දැනුම් දී ඇත. | මුදල් පොත ලිවීමේදී වඩා සැලකිලිමත් ව කටයුතු කළ යුතු අතර දෛනිකව තුලනය කිරීමටත්, අධීක්ෂණය කිරීමටත් කටයුතු යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | මු.රෙ. 206(5) | සමාලෝචිත වර්ෂයේ ආහාර පාන ලබා ගැනීම සම්බන්ධ එකතු වටිනාකම රු. 4,450,810 ක් වූ වවුචර 18 ක වෙනස්කිරීම් සිදුකර තිබුණ ද, සහතික කරන නිලධාරියා විසින් ඒ සඳහා අත්සන් යොදා සහතික කර නොතිබුණි. | ඉදිරියේ දී වවුචර් වල ගෙවීම් වටිනාකම වෙනස් කිරීමේ දී සහතික කරන නිලධාරියාගේ කෙටි අත්සන අදාළ සෑම ස්ථානයකදීම යෙදීමට කටයුතු කෙරේ. | වවුචරයේ සිදුකරන සෑම වෙනස් කිරීමක්ම සහතික කරන ලද නිලධාරියා විසින් අත්සන් යොදා සහතික කළ යුතුය. |
| (v) | මු. රෙ. 261 (3) | දිනපතා මුදල් පොත ශේෂ කර මුදල් ශේෂය පරීක්ෂා කර චෙක්පත් නිකුත් කළ යුතු වුවද, 2022 දෙසැම්බර් 31 සිට 2023 පෙබරවාරි 14 දක්වා කාලය තුළ දෛනිකව මුදල් පොත තුලනය කර ශේෂය පරීක්ෂා නොකර දින 45 ක් අඛණ්ඩව චෙක්පත් මඟින් ගෙවීම් කර තිබුණි. | අදහස් දැක්වීම නිවැරදි නොවේ. | දෛනිකව මුදල් පොත තුලනය කර ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් ශේෂයක් තිබෙන බවට තහවුරු කරගත යුතුය. |
| (vi) | මු.රෙ. 139(7) හා 262(3) | සමාලෝචිත වර්ෂයේ ආහාරපාන මිලදී ගැනීම රු.8,153,485 ක් ගෙවන ලද ගෙවීම් වවුචර 34 ක හා නවාතැන් පහසුකම් රු.15,859,400 ක් ගෙවන ලද ගෙවීම් වවුචර 31 ක ගෙවන නිලධාරියා විසින් වවුචරයෙහි ‘‘ගෙවන ලදී’’ මුද්‍රාව මතුපිට කෙටි අත්සන තබා නොතිබුණි. | ඉදිරියේදී විගණනයේ නිර්දේශ පරිදි ගෙවන ලදී මුද්‍රාව මත කෙටි අත්සන යෙදීමට කටයුතු කෙරේ. | ගෙවන නිලධාරියා විසින් වවුචරයෙහි ‘‘ගෙවන ලදී’’ මුද්‍රාව මතුපිට කෙටි අත්සන තැබීමට කටයුතු කළ යුතුය. |
| (vii) | මුදල් රෙගුලාසි 756 (6) හා 2020.08.28 දිනැති අංක 01/2020 දරන මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛය | 2022 දෙසැම්බර් 31 දිනට වූ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර වාර්තා භාර දී නොතිබුණි. | මෙම කමිටුවේ සභාපති වශයෙන් කටයුතු කළ පරිපාලන නිලධාරිනියගේ අභාවය හේතුවෙන් මෙම කාර්යය අවසන් කිරීමට නොහැකි විය. දැනට සම්පූර්ණ කර ඇති අතර විගණකාධිපතිට ඉදිරිපත් කරනු ලැබේ. | රෙගුලාසි ප්‍රකාරව ජූනි 15 දිනට ප්‍රථම භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

(ඇ) 2021 නොවැම්බර් 16 දිනැති අංක පීඊඩී/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ යහපාලන මාර්ගෝපදේශය හා ඊට අදාළ මෙහෙයුම් අත්පොත

| | | | | |
|---|---|---|---|---|
| (i) | මාර්ගෝපදේශයේ 2.3 පරිච්ඡේදය | වර්ෂ 05 ක කාලයක් ආවරණය වන පරිදි උපායමාර්ගික සැලැස්මක් සකස් කළ යුතු නමුත් 2022 සිට 2025 දක්වා වර්ෂ 04 ක කාලයක් ආවරණය වන පරිදි සකස් කර තිබුණු එම සැලැස්මට ප්‍රමුඛ කාර්යසාධන දර්ශකයන් (KPI) ඇතුළත් කර වාර්ෂිකව යාවත්කාලීන කර මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට ද කටයුතු කර නොතිබුණි. | 2022-2025 උපායමාර්ගික සැලැස්ම තුළ කාර්යසාධක දර්ශක දක්වා නොමැති අතර වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන පදනම් කර ගනිමින් එම සැලැස්මේ අරමුණු වලට අදාළම ක්‍රියාකාරකම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ භෞතික ඉලක්ක හා කාර්යසාධක දර්ශක (KPI) දක්වා ඇත. | මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රමුඛ කාර්යසාධන දර්ශක සහිතව වසර 5 ක් ආවරණය වන පරිදි මාර්ගික සැලැස්ම සකස් කර වාර්ෂිකව යාවත්කාලීන කරමින් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 3.6 පරිච්ඡේදය | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපායමාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් වූ ඵලදායී කාර්යසාධන ඇගයීම් පද්ධතියක් අධිකාරිය වෙත හඳුන්වා දී නොතිබුණි. | පෙන්වා දුන් කරුණු අනුව ඉදිරි වර්ෂ 5 සඳහා උපායමාර්ගික සැලැස්ම යාවත්කාලීන කිරීම 2023 වසරේ සිට සිදු කිරීමට හා 2024/01/15 පෙර මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | 6.6 පරිච්ඡේදය | මුදල් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත කෙටුම්පත් වාර්ෂික වාර්තාව භාර දිය යුතු නමුත් සමාලෝචිත වර්ෂය සඳහා වන කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2023 ජුලි 31 දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2023.07.31 දින භාරදී ඇත. | මාර්ගෝපදේශය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව භාරදීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | මෙහෙයුම් අත්පොත 2.3 පරිච්ඡේදය | අධිකාරිය විසින් තමන්ගේම පරිපාලන හා මූල්‍ය අත්පොතක් සකස් කරගෙන නොතිබුණි. | අධිකාරිය විසින් තමන්ගේම පරිපාලන හා මූල්‍ය අත්පොතක් සකස් කර නොමැත. පරිපාලනය හා විනය කටයුතු වලදී ආයතන සංග්‍රහය අදාළ කර ගැනීම සඳහා 2022/10/19 වන දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව අධිකාරියේ පරිපාලන හා විනය කටයුතු වලදී ආයතන සංග්‍රහයත් රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයත් අනුව කටයුතු කළ යුතුය. | මාර්ගෝපදේශය ප්‍රකාරව මෙහෙයුම් අත්පොත සකස් කරගෙන ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (v) | 3.3 (i) හා (iii) පරිච්ඡේදය | උපායමාර්ගික සැලැස්මට එක් එක් අංශයේ සේවක අවශ්‍යතා විධිමත්ව ඇතුළත් වන ඒකාබද්ධ මානව සම්පත් සැලැස්මක් ඇතුළත් කර නොතිබුණි. | එක් එක් අංශයේ සේවක අවශ්‍යතා ඇතුළත්ව ඒකාබද්ධ මානව සම්පත් සැලැස්මක් සකස් කොට නොමැති අතර ඉදිරියේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර අනුමත කර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | මාර්ගෝපදේශය ට අදාළ මෙහෙයුම් අත්පොත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (vi) | 3.4 (viii) පරිච්ඡේදය | කළමණාකරු (නීති) නිලධාරිණියගේ සේවය 2023 ජුනි 30 දින සිට අවසන් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 නොවැම්බර් 17 දින අනුමැතිය ලබා තිබුණ ද, එම තනතුරේ රාජකාරි සහ වගකීම් බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | එම පුරප්පාඩුව පිරවීමට අදාළව අනුමැතිය තවමත් ලැබී නොමැත. | තනතුරේ රාජකාරි සහ වගකීම් බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (vii) | 3.4 (ix) පරිච්ඡේදය | සුවිශේෂී තත්වයන් යටතේ වැඩ බලන පත්වීමක් සිදු කරන්නේ නම් එය වසරක් නොඉක්මවන කාලයකට සීමා විය යුතු වුව ද, | පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට ඉල්ලීම් කළ නමුත් අනුමැතිය ලැබී නොමැත. වැඩ තහනමකට ලක් වූ | මාර්ගෝපදේශය ට අදාළ මෙහෙයුම් අත්පොත ප්‍රකාරව කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | අධිකාරියේ සාමාන්‍යාධිකාරී ඇතුලු ජෝෂ්ඨ මට්ටමේ තනතුරු 4 ක් හා තෘතිය මට්ටමේ තනතුරු 4 ක් වසර 01 මාස 11 ක සිට වසර 6 මාස 06 ක් දක්වා කාලයක් වැඩබැලීමේ මට්ටමින් හා රාජකාරි ඉටුකිරීමේ මට්ටමින් පවත්වාගෙන තිබුණි. | නිලධාරියෙකුට විරුද්ධව කම්කරු උසාවියේ පවත්නා නඩුව අවසන් නොවීමත්, 2019 වර්ෂයේ සිට සියලු බඳවා ගැනීම් නවතා තිබීමත් හේතුවෙන් බඳවා ගැනීමට නොහැකි වී ඇත. අධිකාරියේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව වැඩ බැලීමේ මට්ටමින් හා රාජකාරි ඉටු කිරීමේ මට්ටමින් තනතුරු ලබා දී ඇත. | යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2011 වර්ෂයේදී අනතුරට පත්වූ නැවකින් ලැබුණු රු.මි 10 ක වන්දියක් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අරමුදල නමින් ගිණුමකට බැර කර භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරමින් තිබුණු අතර ආයෝජන පොලී එකතුවීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට එහි ශේෂය රු.19,486,831 ක් වී තිබුණි. නිශ්චිත කාර්යයක් හඳුනා නොගෙන ඇතිකර තිබූ මෙම අරමුදල වසර 12 ක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි. | 2011 වසරේ සිට හදිසි තෙල් විසිරීමක් සිදු වී ඇති අවස්ථාවකදී භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලැබෙන තෙක් අවශ්‍ය අවස්ථා වලදී මෙහෙයුම් කටයුතු සඳහා මෙම අරමුදලින් මුදල් ලබා ගැනීම සිදු කර ඇත. එසේම අරමුදල ආයෝජනයෙන් මේ වන විට රුපියල් මිලියන 9.4 ක් පොලිය උපයා ගෙන ඇත. | මෙම අරමුදලින් සිදු කළ යුතු නිශ්චිත කාර්යයන් හඳුනාගෙන එය ඵලදායී ආකාරයට යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මාසික සාමාන්‍ය ගෙවීම රු.125,539,830 ක් වුවද, 2022 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය 277,646,779 ක් වූයෙන් අවශ්‍යතාවය ඉක්මවා ජංගම ගිණුමක මුදල් පවත්වාගෙන යන බවට නිරීක්ෂණය විය. | අධිකාරියේ මෙහෙයුම් අතිරික්තය හේතුවෙන් ඇති වූ ධනාත්මක මුදල් ශේෂය ජංගම ගිණුමේ පවතී. එය දෛනිකව ආයෝජනය කරනු ලබන අතර එසේ ආයෝජනය කිරීමෙන් 2023 මුල් මාස 06 තුලදී පමණක් රුපියල් මිලියන 15.5 ක් ආදායම් ලෙස උපයා ඇත. ඉදිරියේ දී අධිකාරියේ අවශ්‍යතාවය පරිදි සංවර්ධන කටයුතු සඳහා මෙම මුදල් භාවිතා කිරීම අපේක්ෂා කෙරේ. | අවශ්‍යතාවය සලකා ජංගම ගිණුමේ මුදල් පවත්වා ගනිමින් කාර්යක්ෂම මූල්‍ය කළමනාකරණයක් ඇතිකර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.209,250,751 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 98,304,624 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 307,555,375 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට MV Xpress Pearl නෞකා අනතුරට අදාළ රු.මිලියන 442.5 ක වියදම් ප්‍රතිපූර්ණය කිරීම් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| MV X Press Perl නෞකා අනතුරට අදාළව රැස් කරන ලද අපද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා වත්තල තාවකාලික අංගනයේ සිට පමුණුගම ගබඩා අංගනය වෙත ප්‍රවාහනය කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් කන්ටේනර් 40 ක් සඳහා රැඳවුම් ගාස්තු ලෙස රු.17,934,000 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි. | මේවා උපද්‍රවකාරී අපද්‍රව්‍ය වීම නිසා පරීක්ෂා කිරීමකින් තොරව ප්‍රවාහනය කිරීමට නොහැකි වූයෙන් සාම්පල් පරීක්ෂා කිරීමෙන් පසුව නෞකාවේ රක්ෂණ ආයතනයේ නියෝජිතයන් සමඟ සාකච්ඡා කර 2021 ඔක්තෝම්බර් මස වත්තල සිට පමුණුගම ගබඩාවට ප්‍රවාහනය කිරීම ආරම්භ කරන ලදී. | රක්ෂණ සමාගමෙන් සියළුම මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොගෙන වරායන් තුළ සේවා නියුක්ත කර ඇති නිලධාරීන්ට අපද්‍රව්‍ය සේවා ප්‍රතිග්‍රහන පහසුකම් සඳහා 2017 වර්ෂයේ සිට 2019 දක්වා දිනකට රු.750 ක් බැගින් ගෙවා ඇති රු.1,951,550 ක දීමනාව සම්බන්ධයෙන් මූලික විමර්ෂණයක් සිදු කරන ලෙස 2021 දෙසැම්බර් 28 දිනැති විගණන හා කළමනාකරණ කමිටුව විසින් ලබා දී ඇති නිර්දේශය ක්‍රියාත්මක කර වගකිවයුතු පුද්ගලයින්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධිකාරියේ විමර්ශන කමිටුවට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සහිතව ලේකම්තුමා වෙත දැනටමත් දන්වා ඇත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමටත්, අනුමැතිය නොමැතිව ගෙවීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කළ යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොලිසැක් මළු 20,000 ක් මිලදී ගැනීම සඳහා 2022 පෙබරවාරි 07 දින ලැබී තිබූ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය අනුව මළු 10,000 ක් 2022 පෙබරවාරි 23 දින ලබාගෙන ඊට අදාළ රු.375,000 ක් සැපයුම්කරු වෙත ගෙවා නැවත 2022 මාර්තු 09 වන දින ඉතිරි මළු 10,000 ලබා ගැනීම සඳහා ඇනවුමක් නිකුත් කර තිබුණ ද, සැපයුම්කරු තොග අවසන් බව දන්වා තිබූ බැවින් 2022 ජූනි 28 දින නැවත මිල ගණන් කැඳවා මළු 10,000 ක් රු.1,000,000 කට මිලදීගෙන තිබුණි. ඒ අනුව මළු 20,000 ක අවශ්‍යතාවය මත මිල කැඳවා 10,000 ක් පමණක් ඇනවුම් කිරීම හේතුවෙන් අධිකාරියට රු.625,000 ක පාඩුවක් සිදු වී තිබුණි. | මෙම විගණන නිරීක්ෂණය සඳහා අධිකාරියේ විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත මෙම විමර්ශන වාර්තාව, අභ්‍යන්තර විගණන වාර්තාව සහ සහකාර කළමනාකරු (පාලන) ගේ පිළිතුර 2023.07.27 වන දින පැවති අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර, මේ සඳහා අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් උපදෙස් ලබා දෙන ලදි. | විමර්ශණ වාර්තාවේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |

### 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගෙවීම් වවුචර් සකස් කර නිලධාරීන්ට පසුව ගෙවීම් කිරීමේ අරමුණින් 2022 දෙසැම්බර් 31 දිනය යටතේ අංක 3143 සිට 3175 දක්වා වූ ගෙවීම් වවුචර් 32 කට අදාළ අංක මුදල් පොතේ සටහන් කර තිබුණි. එසේම චෙක්පත් පසුව ලබාදීමේ අරමුණින් අංක 210901 සිට 210950 දක්වා චෙක්පත් 50 ක් ඇතුළත් චෙක් පොතක් වෙන්කර එම අංක කිසිදු ගෙවීම් විස්තරයක් රහිතව චෙක්පත් නිකුත් කිරීමේ ලේඛනයෙහි සටහන් කර පසුව එම චෙක්පත් අවලංගු කර තිබුණි. මෙම මතභේදකාරී ක්‍රියාවන් සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ අවධානය යොමු වී නොතිබුණි. | මේ සඳහා දැනටමත් මූලික විමර්ශන කමිටුවක් පත්කර ඇති අතර, එම කමිටුවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදුකරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිසි අභ්‍යන්තර පාලන ක්‍රම පවත්නාගෙන යාමට කටයුතු කළයුතු අතර විමර්ශන කමිටුවේ නිර්දේශ පරිදි වගකිව යුතු නිලධාරින් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | MV X Press Pearl නෞකා අනතුරට අදාළව අධිකාරිය විසින් දරන ලද වියදම් සහ අනෙකුත් ආයතන විසින් දරන ලද වියදම් කොටසක් ද ඇතුළුව අවස්ථා 13 ක දී ප්‍රතිපූර්ණය සඳහා නෞකාවේ රක්ෂණ සමාගමට යොමුකර තිබූ ඇ.ඩො 48,408,208 කින් ප්‍රතිපූර්ණය කර තිබූ ප්‍රමාණය ඇ.ඩො. 6,725,298 ක් හා රු. 20,317,670 ක් විය. ඉල්ලුම් කරන ලද ඇ.ඩො 32,379,067 ක් ඇස්තමේන්තුගත වියදම් වීම හා පරිපාලන වියදම් සියයට 25 ක් ඇතුළත්ව තිබීම හේතුවෙන් රක්ෂණ සමාගම විසින් ප්‍රතික්ෂේප කර ඇති බවටත්, ඉදිරියේ දී ප්‍රතිපූර්ණයන් සිදු නොකරන බවටත් විගණනය වෙත තොරතුරු ඉදිරිපත් විය. | MV X Press Pearl නෞකාවට අදාළව රක්ෂණ ආයතනය වෙත ඉදිරිපත් කරන ලද මුලු අන්තර් හිමිකම් ඉල්ලීම්වලින් එනම් ඇමරිකානු ඩොලර් මිලියන 48.4 කින් සත්‍ය වියදම් ප්‍රතිපූරණය පමණක් වන රක්ෂණ මූලධර්මය අනුව ඇමරිකානු ඩොලර් මිලියන 32.3 ක් ඇස්තමේන්තුගත වියදම් නිසාත්, එසේම සියයට 25 ක පරිපාලන ගාස්තුවක් ඇතුළත් කර ඇති නිසාත් එම මුදල ගෙවීම රක්ෂණ ආයතනය විසින් ප්‍රතික්ෂේප කර ඇත.<br>ඉදිරිපත් කර ඇති හිමිකම් ඉල්ලීම සඳහා තවත් ඇමරිකානු ඩොලර් මිලියන 6.7 කට ආසන්න මුදලක් ලැබීමට යෝජිතව ඇත. | ප්‍රතික්ෂේප කිරීම් සලකා බලා ඉදිරියේ දී ප්‍රතිපූර්ණය සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ දී නිසි සැලකිල්ලකින් කටයුතු කිරීමටත් සියලු ප්‍රතිපූර්ණයන් ලබාගැනීමටත් අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 මැයි 20 දින කොළඹ වරායට නාවික සැතපුම් 9.5 ක් දුරින් සිදු වූ MV X Press Pearl නෞකා අනතුරට අදාළව අධිකාරිය විසින් අපරාධ වගකීම යටතේ 2022 නොවැම්බර් 15 දින නඩු පවරා තිබුණ ද, එම නඩුවේ තීන්දුව 2023 ජූලි 10 දින දක්වාම ලබාදී නොතිබුණි. මීට අදාළව සිවිල් වගකීම යටතේ 2023 මැයි මාසයේදී සිංගප්පූරු වානිජ අධිකරණයේ නඩු පවරා තිබුණු අතර එහි ප්‍රගතිය වාර්තා කර නොතිබුණි. | නෞකා අනතුරට අදාළව අපරාධ වගකීම යටතේ 2022 නොවැම්බර් මස 15 දින කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ පැවරූ අංක 4118/2022 දරන නඩුව තව දුරටත් විභග වෙමින් පවතී. 2023.01.20 දින නඩුව මුලින්ම කැඳවන ලද අතර ඉන්පසු 2023.02.27, 2023.02.28, 2023.06.01 හා 2023.06.15 වන දින නඩුව කැඳවන ලදී. අධිකරණ ක්‍රියාවලිය සඳහා ගතවන කාලසීමාව අනුව තීන්දුව ලබාදීමේ දිනය තීරණය වේ. නඩුව සඳහා අවශ්‍ය කටයුතු මෙම අධිකාරිය සිදු කරන අතර තීන්දුව ලබා දීමට ගතවන කාලය පිළිබඳව අප අධිකාරියට බලපෑම් කිරීමේ හැකියාවක් නැත.<br>සිවිල් වගකීම යටතේ ඉහත නෞකා අනතුරට අදාලව 2023 මැයි මාසයේ සිංගප්පූරු අධිකරණයේ නඩු පැවරීම සිදු කර ඇති අතර එම සියළුම කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව හරහා නීතිපතිතුමා විසින් සිදු කරන ලබයි. එයට අවශ්‍ය සහයෝගය ලබාදීම මෙම අධිකාරිය විසින් සිදු කරනු ලබයි. | වාසිදායක ආකාරයට නඩු කටයුතු අවසන් කරගැනීම සම්බන්ධයෙන් අධිකාරියේ වගකීම නිසි ආකාරයට ඉටුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 ජූනි 06 වන දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ වරායවල් ඇතුළු වෙරළ කලාපය තුළ අපද්‍රව්‍ය කළමනාකරණයට සම්බන්ධිත සියළු ආයතන නියෝජනය වන පරිදි පිහිටුවා තිබුණු අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රාදේශීය කමිටු 84 ක් අවම වශයෙන් මසකට වරක් හෝ රැස් විය යුතු වුවද, කමිටු 64 ක් 2022 වර්ෂයේ දී රැස්වී නොතිබුණු අතර කමිටු 12 ක් රැස්වීම් වාර එකක් හා කමිටු 04 ක් රැස්වීම් වාර දෙකක් පමණක් පවත්වා තිබුණි. එමෙන්ම කමිටු 63 ක් වර්ෂය තුළ වෙරළ කලාප පරීක්ෂා කිරීම සිදුකර නොතිබූ බවට නිරීක්ෂණය විය. ඒ අනුව වෙරළ පරිසරයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම, ධීවර හා සංචාරක ක්ෂේත්‍රයන් හි ආදායම් වැඩි කිරීම ආදී වශයෙන් මෙම කමිටුවලින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොමැති බවට නිරීක්ෂණය විය. | රට තුළ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් ඉන්ධන නොමැති වීම නිසා බලාපොරොත්තු වූ පරිදි බලාත්මක කිරීමේ ඒකක වලට අදාළ රැස්වීම් සහ ක්ෂේත්‍ර පරීක්ෂා පැවැත්වීමට නොහැකි විය.<br>මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබාදීම සීමා කිරීම හේතුවෙන් ද අපේක්ෂිත ප්‍රගතිය ලඟාකරගත නොහැකි විය.<br>2023 වර්ෂයේදී අපද්‍රව්‍ය කළමනාකරණ කමිටුවල ජාතික කමිටුව රැස්කර එක් එක් ආයතනවල කාර්යය භාර්යයන් වෙන් වෙන් වශයෙන් හඳුනා ගන්නා ලද අතර ඉදිරියේ දී මෙම ක්‍රියාවලිය වඩාත් ඵලදායී සහ කාර්යක්ෂම ලෙස සිදු කිරීම සඳහා ජංගම දුරකථන යෙදවුමක් සකස් කරමින් පවතී. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ වරායවල් ඇතුළු වෙරළ කලාපය තුළ අපද්‍රව්‍ය කළමනාකරණයට සම්බන්ධිත සියළු ආයතන නියෝජනය වන පරිදි පිහිටුවා තිබුණු අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රාදේශීය කමිටු 84 ක් අවම වශයෙන් මසකට වරක් හෝ රැස් විය යුතු අතර අපේක්ෂිත ප්‍රගතිය ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ආහාර පාර්සල් වශයෙන් ලබාගැනීම සඳහා මිල ගණන් ලබාගත් නමුත් ආහාර වර්ග වෙන වෙනම මිලදී ගෙන තිබීමෙන් එම වියදම අරපිරිමැසුම්දායී බවට සනාථ කළ නොහැකි විය. තවද, ගෙවීම් වවුචර් 61 කින් ආහාර පාන මිලදී ගැනීම හා නවාතැන් ගාස්තු සඳහා රු.23,154,710 ක් ගෙවීමට අදාළව නිකුත් කර තිබූ බිල්පත්වල අනුක්‍රමික අංක නොවෙනස්ව අනුපිළිවෙලටම තිබීම හා අධිකාරියේ නම සඳහන් කර නොතිබීමත්, බිල්පත්වල සඳහන් සැපයුම්කරුගේ නම වෙනුවට වෙනත් නම්වලින් චෙක්පත් ලියා තිබීමත් හේතුවෙන් මෙම ගෙවීම්වල නිවැරදිතාවය සනාථ කළ නොහැකි විය. මෙම මතභේදාත්මක කරුණු කෙරෙහි වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය ද යොමු වී නොතිබුණි. | ආහාර වර්ගය හා ඒ ඒ ආහාර වර්ගයෙන් මිල දී ගනු ලබන ප්‍රමාණයන් හා වටිනාකම් දක්වා ඇත.<br>බිල්පත් ලිවීමේ දී අධිකාරියේ නම සඳහන් නොවීම එම අවස්ථාවේ දී අවධානයට ලක් නොවුනු අතර ඉදිරියේ දී ඒ සම්බන්ධයෙන් අවධානයෙන් සිටින බව දන්වමි.<br>එසේම අධිකාරියට නිකුත් කරන ලද බිල් අනුක්‍රමික අංක අනුපිළිවෙලට තිබීම අධිකාරියේ පාලනයෙන් තොරව සිදුව ඇති කරුණක් බව ද, සැපයුම්කරු හා චෙක්පතේ සඳහන් නම අතර වෙනසක් පැවතියේ සැපයුම්කරුගේ ඉල්ලීම මත බව ද දන්වමි. | මිල ගණන් ලබාගත් ආකාරයට මිලදී ගැනීම් සිදුවිය යුතු අතර<br>අධිකාරියේ නමට නිකුත් කර ඇති බිල්පත් සඳහා තෝරාගත් සැපයුම්කරුට විනිවිදභාවයකින් යුක්තව ගෙවීම් කිරීම් සම්බන්ධයෙන් නිලධාරීන් වගකීමට බැඳී සිටිය යුතුය. |
| (ඊ) | MV X Press Pearl නෞකා අනතුරින් එකතුකළ අපද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා 2021 වර්ෂයේ අවස්ථා දෙකක දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවන ලෙස සැපයුම්කරු තෝරාගෙන පැයකට රු.1400 ක් හා 1500 ක් බැගින් ගෙවමින් කුලියටගත් forklift යන්ත්‍රයේ | රට තුළ පැවති කොවිඩ් තත්ත්වය හා සංචරණ සීමා හේතුවෙන් ආයතන වසා දැමීම මත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණයෙන් අනුගමනය කිරීමට නොහැකි වී ඇත. විවිධ ආයතන හා පුද්ගලයන්ගෙන් | අවශ්‍යතාවය හඳුනාගනිමින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගිවිසුම් කාලය මාස 07 ක් ඉතිරිව තිබිය දී නැවත 2022 මැයි මාසයේ දී මිල ගණන් කැඳවා එම සැපයුම්කරුගෙන්ම පැයකට රු.2900 ක් බැගින් වන මිල ගණන් එම යන්ත්‍රය ස්ථාපිත කර ඇති වත්තල ගබඩාව හරහා ලබාගෙන ලංසු වසා දින 03 කට පසුව විවෘත කර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම මතභේදයට තුඩු දෙන කරුණක් බවට නිරීක්ෂණය විය. මෙම යන්ත්‍රය සඳහා 2022 වර්ෂයට අදාළව ගෙවා තිබුණු කුලිය රු.2,433,800 ක් වූ අතර අධිකාරියට දීර්ඝකාලීනව එම යන්ත්‍රයක අවශ්‍යතාවය සලකා බලා නව යන්ත්‍රයක් මිලදී ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබීමෙන් වාර්ෂිකව විශාල පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. | ලබාගත් තොරතුරු මත මිල ගණන් ලබාගන්නා ලදී. ඩොලරයේ අගය ඉහළ යාම හා මිල ගණන් ඉතා සීග්‍ර ලෙස ඉහළ යාම මත ටෙන්ඩර්පත් විවෘත කළ පසුව මීගමුව ප්‍රාදේශීය කාර්යාලයට සැපයුම්කරුවෙකු විසින් යොමු කරන ලද මිල ගණන් 2022.05.30 වන දින විවෘත කර වාසිදායක තත්ත්වය මත පැයකට රු.2900 ක මුදලට ටෙන්ඩරයක් ප්‍රදානය කර ඇත. තවද, මහාභාණ්ඩාගාරය විසින් ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම නවතා ඇති බැවින් නව යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා අවධානය යොමු කර නැත. | |
| (උ) | MV X Press Pearl නෞකා අනතුර හේතුවෙන් රැස්කළ අපද්‍රව්‍ය ගබඩා කිරීම සඳහා ඇස්තමේන්තු සකස් නොකර වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර තාක්ෂණික ඇගයීමකින් ද තොරව වර්ග අඩි 25,000 ක අවශ්‍යතාවය වෙනුවට වර්ග අඩි 48,765 ක විශාලත්වයෙන් යුතු ගබඩාවක් තෝරාගෙන 2021 ජූනි මාසයේ සිට මුල් මාස 06 ට මාසයකට රු.1,706,775 ක් ද, දෙවන මාස 06 ට ඊට වඩා සියයට 40 ක් වැඩියෙන් මාසයකට රු.2,400,000 ක් ද වශයෙන් ගාස්තු වැඩිකර ගෙවීම් සිදු කර තිබුණි. මෙම ගබඩාව සඳහා රජයේ මාසික තක්සේරුව රු.1,800,000 ක් වීමෙන් දෙවන මාස 06 ක කාලය සඳහා රු.3,600,000 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර වර්ග අඩි 30,000 ක් සඳහා මාසිකව රු.1,755,000 ක් වූ ලංසුව ප්‍රතික්ෂේප කිරීමෙන් රු.3,580,650 ක පාඩුවක් සිදුව ඇති බවට ද නිරීක්ෂණය විය. තවද, මෙම කාර්යය සඳහා ගබඩාවක් වසරක කාලයකට කුලියට ගැනීමට ලබාදී තිබූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2022 දෙසැම්බර් 14 දිනෙන් අවසන්ව තිබුණ ද, මෙම ගබඩාවේ ඉදිරි අවශ්‍යතාවය, 2022 සැප්තැම්බර් 06 දිනෙන් පසුව කුලිය ප්‍රතිපූර්ණය නොකිරීමට නෞකා සමාගම තීරණය කර තිබීම යනාදී කරුණු කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | මෙම ගබඩාව තුළ හුදෙක් ගබඩා කිරීම පමණක් නොව, ගබඩා කරන ලද ද්‍රව්‍ය කාණ්ඩ කිරීම, නැවත පරිසරයට එක්කළ හැකි ද්‍රව්‍ය වෙන් කිරීම, උපකරණ හා වාහන ආරක්ෂිතව ගාල් කර තැබීම වැනි අවශ්‍යතාවයන් ද පැවති බැවින් වර්ග අඩි 25,000 ක සීමාව අවම අවශ්‍යතාව ලෙස සලකමින් ඊට වැඩි වර්ග ප්‍රමාණයක් කෙරෙහි අවධානය යොමු කරමින් ඇගයීම් ක්‍රියාවලිය සිදු කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරියේ එකඟතාවය, රක්ෂණ නියෝජිත ආයතනයේ එකඟතාවය අනුව මෙම කාර්යය සඳහා සුදුසුම ගබඩාව යන කරුණු අනුව මෙම ගබඩාව කුලී පදනම මත ලබාගැනීමට හා කාලය දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. | අවශ්‍යතාවය අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | අධිකාරිය සතු මෝටර් රථයක් 2021 ජූනි 23 දින ජපානයේ භාවිතා කරන ලද ගියර් පෙට්ටියක් යොදා රු.381,450 ක වියදමකින් අලුත්වැඩියා කළ නමුත් ගියර් පෙට්ටියේ දෝෂයක් මත ධාවනය කිරීමට නොහැකි වී තිබුණි. මෙම අලුත්වැඩියාව තාක්ෂණික නිලධාරියකු විසින් සහතික කර නොතිබුණු අතර පැරණි ගියර් පෙට්ටිය ද ගබඩාව වෙත භාර දී නොතිබුණි. මෙම අලුත්වැඩියාවෙන් පසු මෝටර් රථය සඳහා කි.මී 30,000 ක වගකීම් කාලයක් ලබා දී තිබුණ ද, මෝටර් රථය එම ආයතනය වෙත භාර දී නිසි පරිදි අලුත්වැඩියා කර ගැනීමට කටයුතු නොකර 2021 ජූනි 21 දින සිට කුලී පදනම මත මෝටර් රථයක් ලබාගෙන ඒ සඳහා 2023 මාර්තු 12 දින දක්වා රු.3,741,685 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඔවුන්ට එරෙහි කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | Covid 19 තත්ත්වය හා රට පූර්ණ වශයෙන් වසා දැමීම හේතුවෙන් තාක්ෂණ නිලධාරියෙකුගේ හෝ මෝටර් රථ ඉන්ජිනේරු අභ්‍යාස ආයතනයේ උපදේශන සේවාව ලබා ගැනීමට නොහැකි විය. Mv X – Press Pearl නෞකා අනතුරේ රාජකාරි කටයුතු සිදු කිරීම සඳහා අධිකාරියේ සියලුම සේවකයින් සේවයට කැඳවීමත්, ඔවුන්ට ප්‍රවාහන පහසුකම් සැපයීමත් හේතුවෙන් සංචිත වාහනයක් සභාපති වෙත ලබා දීමට නොහැකි වීමෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය මත කුලී පදනම මත වාහනයක් ලබා ගැනීමට කටයුතු කරන ලදී. | මෙම අලුත්වැඩියාව සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර වාහනය යථා තත්ත්වයට පත්කිරීමටත්, වාහනය කුලියට ගැනීමේ අවශ්‍යතාවය සලකා බැලීමටත් කටයුතු කළ යුතු අතර බැහැරවීම් වලදී වගකිවයුතු නිලධාරීන්ට සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය විසින් 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා මුද්‍රණය කරන ලද පිරිවැය රු.709,809 ක් වූ සිංහල හා දෙමළ සඟරා 3,110 ක් හා සමුදුර පුවත් පත් 15,387 ක් බෙදා නොහැර ගබඩාවේ රඳවා තිබුණි. | ඉදිරියේ පවත්වන ප්‍රදර්ශන සහ අනෙකුත් අවශ්‍යතා සඳහා මෙම සඟරා සහ පුවත්පත් යොදා ගැනීමේ හැකියාව පවතී. | අවශ්‍යතාවය හඳුනාගෙන මුද්‍රණය කිරීමටත්, බෙදාහැරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) | 2011 වර්ෂයේ මිලදී ගන්නා ලද රු.672,000 ක් වටිනා ඩිංගි බෝට්ටුවක් හා 2021 වර්ෂයේ මිලදී ගන්නා ලද රු.255,000 ක අධිශීතකරණයක් අනාරක්ෂිතව භාවිතයට නොගෙන ආයතනයේ රඳවා තිබුණි. | ඩිංගි බෝට්ටුව අපහරණය කිරීමට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් හඳුනා ගන්නා ලද අතර එම බෝට්ටුවේ එංජිම මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලයට ලබා දී ඇත. MV X – Press Pearl නෞකා අනතුර ආශ්‍රිතව එක්රැස් වන සත්ත්ව කොටස් හා ජල සාම්පල ගබඩා කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ තබාගෙන ඇති අධි ශීතකරණය ඉදිරියේ දී දකුණු පළාත් රසායනාගාරයට යැවීමට සැලසුම් කර ඇත. | මෙම උපකරණවල අවශ්‍යතාවය හා භාවිත හැකියාව පිළිබඳ පරීක්ෂා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමටත් එතෙක් ආරක්ෂිතව තැබීමටත් කටයුතු කළ යුතුය. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට අනුමත සමස්ත කාර්ය මණ්ඩලය 230 ක් අතුරින් සාමාන්‍යාධිකාරී තනතුර හා ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 10 ක් ඇතුලුව තනතුරු 30 ක් පුරප්පාඩුව පැවතුණි. | 2022 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වී පැවති තනතුරු සියල්ලම බඳවා ගැනීමට රේඛීය අමාත්‍යාංශය හරහා අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය වෙත හා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ලිඛිතව ඉල්ලීම් සිදු කරන ලදී. | පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට හෝ පවතින සේවා අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කර ගැනීමට හැකිවන ආකාරයට තනතුරු සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ආ) | කළමනාකරු (පරිපාලක සහ මූල්‍ය) තනතුරෙහි රාජකාරි ඉටුකිරීම සඳහා පත් කර තිබූ නිලධාරියාගේ නිත්‍ය තනතුර සහකාර කළමණාකරු (මූල්‍ය) වුවද, ඔහු ගණකාධිකාරී වශයෙන් ද ලියකියවිලිවලට අත්සන් තබා තිබුණි. | අදහස් දැක්වීම නිවැරදි නොවේ. | අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව නිවැරදි තනතුරු නාමය භාවිතා කළ යුතුය. |